# 1.16 පාලි සාහිත්‍යයේ *පණ්ඩිත* ශබ්දය පිළිබඳ විමර්ශනයක්

අරුණ කේ. ගමගේ
පාලි හා බෞද්ධ අධ්‍යයනාංශය, කැලණිය විශ්වවිද්‍යාලය.

## ABSTRACT

වර්තමාන පොදු ව්‍යවහාරයට අනුව විද්වතා, එනම් ඇති උපාධිධරයා මෙනමින් අදහස් කෙරේ. ***පණ්ඩිත*** යන වචනය පාලි සාහිත්‍යයේ විවිධ සන්දර්භයන්හි උපයුක්ත වන්නකි. **ධම්මපදපාළි** ය වැනි ග්‍රන්ථවල මෙය භාවිත වන්නේ වඩාත් සරල, √ පැහැදිලි අර්ථයකිනි. එහෙත් මේ පිළිබඳ නෛරුක්තික වශයෙන් හෝ භාෂාවිද්‍යාත්මක වශයෙන් ඉදිරිපත් කෙරෙන විවරණයන් ත්‍රිපිටක පාළියෙහි දක්නට නොලැබේ. ***පණ්ඩිත*** ශබ්දය ගමන් අර්ථ ඇති **පඩි** ධාතුවෙන් නිපන්නේ ය. ශ්‍රී තාරානාථ තර්ක වාචස්පතිහු මේ වචනය සඳහා ***පණ්ඩා තත්ත්වානුගාබුද්ධිර්ජාතා' ස්‍ය*** යනුවෙන් ද ***ශාස්ත්‍රතාත්පර්යඥේ විදුෂි*** යනුවෙන් ද අර්ථ දෙකක් ඉදිරිපත් කරති. (**ශබ්දස්තෝම මහානිධි** - ශ්‍රී තාරානාථ තර්කවාචස්පති, 1814, කල්කටා, 236 පිටුව.) මෝනියර් විලියම්ස් , රොබට් චිල්ඩර්ස් , රීස් ඩේවිඩ්ස් යනාදී විද්වතුන්ගේ අර්ථකථන ද මේ සම්බන්ධයෙන් විවිධ ය.

***පණ්ඩිත*** ශබ්දය සඳහා වඩාත් දාර්ශනික පක්ෂයට නැඹුරු වූ අර්ථකථනයන් පාලි අට්ඨකථාවලියෙහි අන්තර්ගත වී තිබෙනු දක්නා ලැබේ. අභ්‍යන්තර හා බාහිර යනුවෙන් ද්විවිධ වන ලෝකයේ පවත්නා සචරාචර වස්තූන්ගේ සංඝටකයන් පිළිබඳ සුවිශද ඥානයකින් ද ඒවායේ අනවරත සංචලනය පිළිබඳ සුසංප්‍රජානනයකින් ද යුතු පුද්ගලයා ථෙරවාදී බෞද්ධ සම්ප්‍රදායයේ ***පණ්ඩිත*** යන වචනයෙන් වාච්‍ය කෙරේ. **පපඤ්චසූදනී, සාරත්ථප්පකාසිනී** යන අට්ඨකථාවන්හි පණ්ඩිත ශබ්දය සඳහා නවමු අර්ථ කථන ඉදිරිපත් වී තිබෙනු දක්නා ලැබේ. අට්ඨකථා සාහිත්‍යයේ ***පණ්ඩිත*** ශබ්දය සඳහා ප්‍රදානය වන වඩාත් දාර්ශනික හා සදාචාර සම්පන්න වූත් අර්ථකථනය දක්නට ලැබෙන්නේ **පරමත්ථජෝතිකා** හා **පරමත්ථදීපනී** (උදානට්ඨකථා) යන ග්‍රන්ථවල ය. මෙම විග්‍රහයට අනුව පණ්ඩිතයාට ස්ථාවර වූ ඥානයක් නොමැත. ඔහු නිශ්චිත ව බැසගත් නිගමනයන් හෝ මතවාදවලට උරුමකම් නො කියන්නෙකි. මෙයින් අදහස් වන්නේ නිරතුරුව ම ප්‍රතිසංස්කරණයට හා පිරිපහදුවට ලක්වන ඥානපථයකින් හා නම්‍යශීලී අදහස්වලින් යුක්ත වන්නා ***පණ්ඩිත*** යන නාමයට යෝග්‍ය බව යි. සුචරිතවත් චරිතාපදානයකට ද ඔහු උරුමකම් කිවයුතු ම ය. ***පණ්ඩිත*** ශබ්දයේ ඓතිහාසික ක්‍රම විකාශය හා ඒ ඒ යුගවලදී මෙයට ප්‍රදානය වූ විවිධ විසිතුරු අර්ථකථනයන් පිළිබඳව මෙහිදී විමර්ශනයට ලක්කෙරෙන්නේ සංස්කෘත කෝෂ ග්‍රන්ථවලට හා පාලි අට්ඨකථා, ටීකාවලට මෙන් ම බටහිර විද්වතුන්ගේ අදහස්වලට ද අවධානය යොමු කරමිනි.